# ගම්මඩු ශාන්තිකර්මය මුල්කර ගත් අංකෙළිය ජනක්‍රීඩාව පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

යූ.ජේ.ජී. ගමගේ[1], එච්.කේ. ලොකුහැන්නදිගේ[2]

වර්තමානය වනවිට පැරණි සම්ප්‍රදායන් හා ජනශ්‍රැතික දැනුම වියැකී යමින් පවතී. ඒ බැවින් සාම්ප්‍රදායික දැනුම නව සමාජයට උරුම කරදීම අරමුණු කරගනිමින් නැගෙනහිර පළාතේ අම්පාරේ දිස්ත්‍රික්කයේ "පානම" ගම්මානයේ හි දැකගත හැකි අංකෙළිය හා බැදි සම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කරනු ලැබේ. වැඩිහිටියන් 10 දෙනෙකු සමඟ සිදුකළ සම්මුඛ සාකාච්ජා මුල්කරගත් ක්ෂේත්‍ර අධ්‍යයන හා සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය මෙහි ක්‍රමවේදය වේ. ගම්මඩු ශාන්තිකර්මය රඟ දැක්වීමට මත්තෙන් සිදුකරන අංකෙළිය ජන ක්‍රිඩාව අදවන විට ඉතිරි වී ඇත්තේ ඉතා සුළු ප්‍රදේශයක පමණි. ඒ අතුරින් පානම ප්‍රදේශයේ වර්තමානයේදී ද ක්‍රියාත්මකවන මෙම ක්‍රීඩාව කායික, මානසික සුවතාවය හා විනෝදාස්වාදය මුල් කරගත් අන්‍යෝන්‍ය සහයෝගිතාවය ද ඉස්මතු කරන ආගමික ක්‍රිඩාවකි. විවිධ හේතූන් මුල් කරගනිමින්, මෙම ප්‍රදේශයේ පුද්ගලයන් වෙනත් ප්‍රදේශයන්හි පදිංචියට යෑම හා තාක්ෂණික දියුණුව නිසාවෙන් සාම්ප්‍රදායික විශ්වාසයන් පිළිබඳව සැක මතුවීම යන හේතූන් මත පදනම්ව අංකෙළිය අභාවයට යනු ඇත. නූතනයේ දී ශාන්තිකර්ම ආශ්‍රිතව සිදු කරන ලද ජන ක්‍රිඩාවන් පිළිබඳව උනන්දුවක් නොමැති බව නිසා ඒවා ක්ෂය වීමෙන් පවතී. සිංහල, ද්‍රවිඩ දෙපිරිසම එක් වී සිදු කරන මෙම ජන ක්‍රිඩාව පාරම්පාරික පවුල් හරහා උඩුපිල හා යටිපිල ලෙස දෙපාර්ශයකට බෙදී ගෝන අඟකින් සමන්විත ''හොඳකහඳ ගස'' දෙපැත්තට අදිමින් සිදු කරයි. මෙම ක්‍රිඩාවේ දිනුම හෝ පැරදුම අනුව ගමට යහපතක් සිදුවන බව ඔවුන් විශ්වාස කරති. ජයගත් පිරිස විසින් පැරදි පර්ශවයට ආශීර්වාද කර වස්, දොස් දුරුකර යහපත ප්‍රාර්ථනා කරයි. ආරම්භයේ සිට අවසාන දක්වාම මෙම ක්‍රීඩාවටම වෙන් වූ සුවිශේෂී කවි පන්ති මාලාවක් හඳුනාගත හැකිය. මෙම ක්‍රීඩාවේහි නියැලීමේ දී ඔවුන් විසින් අනුගමනය කරන ලද සුවිශේෂී වත්පිළිවෙත් හා සිරිත් විරිත් රාශියකි. සමස්ථ ගමම කිල්ලට හසු නොවමින්, පේවෙමින් මෙම ක්‍රිඩාවේ නියැලෙන අතරම අවමංගල අවස්ථාවක දී, ගර්භණී අවස්ථාවක දී ද ඒවාටම වෙන්වූ විශේෂිත වත්පිළිවෙත් හා සිරිත්, විරිත් මාලාවක් අනුගමනය කරනු ලැබේ. දින 15 පුරා පවත්වන මෙම ක්‍රිඩාවෙහි අවසාන දින දෙක පමණක් කාන්තාව වෙනුවෙන් විවෘත වෙයි. පත්තිනි දෙවියන්ගේ ආශිර්වාදය මුල්කර ගත් මෙම ක්‍රිඩාව දියකැපීමේ මංගල්‍යයෙන් අවසන් වේ. පැරණි ශාන්තිකර්ම හා ජනශ්‍රැතික දැනුම ආරක්ෂා කරමින් ඉදිරි අනාගතයට ගෙනයෑමට රජයේ අවධානය යොමුවිය යුතුය.

ප්‍රමුඛ පද : අංකෙළිය, පානම, හොඳකහඳ ගස, අංගම් මඩුව, ජනක්‍රිඩා

1 2 මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. jeewanthauditha@gmail.com